

# මෙටාෂාගේ කැළෑ ගමන

සෙනාරා තවසරි රත්නායක

# මෙටාෂාගේ කැළෑ ගමන

## සෙනාරා තවසරී රත්නායක

### පළමු දිග හැරීම

මහමායා බාලිකා විද්‍යාලය

**1 ශ්‍රේණිය E**

**2026.04.20**

**ISBN:978-624-211-026-4**

# පිදුම

මෙම පොත සෑදීමට මට උදව් කළ මගේ අම්මාට හා තාත්තාටත් මෙය කරන්නට උපදෙස් ලබා දුන් මාගේ ගුරුතුමියටත් විදුහල්පතිතුමියටත් උදව් කළ හැමෝටමත් ස්තූතියි! මම මගේ පොතට ආදරෙයි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට ලැබීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහනයක්.මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසැල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සංනිවේදන නිපුණතා සාරධර්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා අරමුණු කොට ගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලූ සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය ,

පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දැල, දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10



එකමත් එක රටක හිටියා මෙටාෂා කියලා ගැහැණු ළමයෙක්. එයාගේ ගෙදර තිබුනේ කැළයක් ළඟ. එයා හරිම ආසාවෙන් හිටියේ කැළෑවට යන්න. ඒත් එයාගේ අම්මා එයාට කැළෑවට යන්න එපා කියලා තිබුනේ.



දවසක් මෙටාෂා අම්මට හොරෙන් කැළෑවට ගියා.



ඔහොම යනකොට මෙටාෂාට ඇළක් හම්බ වුණා. ඒ ඇළේ මාළුවෝ පීනනවා. එයා ඇළට බැහැලා ගොඩක් විනෝද වුණා. ඇළ දෙපැත්තේ ලස්සන මල් පිපිලා හරිම සුවඳයි. ගස්වල කුරුල්ලෝ හිටියා. තව එයා දැක්කා ජිරාෆ්ලා ඇළ පැත්තට එනවා.



ටික ටික හවස් වේගෙන ආවා. එයා ගෙදර යන්න පිටත් වුණා. ඒත් එයාට පාර හොයා ගන්න බැරි වුණා. එයා තව තවත් කැළෑව ඇතුලට ගියා.



ඔහොම යනකොට එයාට ගල් ගුහාවක් හම්බ වුණා.

ඒ වෙනකොට හොඳටම රෑ වේගෙන ඇවිත් තිබුණා.

එයා ඒ ගල් ගුහාව ඇතුළට ගියා.



ඇතුළට ගිහින් බලද්දි ඒක ලස්සන ගුහාවක්.එයා හිතුවා ඒ ගල් ගුහාවේ එදා රෑ ඉන්න.එයා දර හොයන් ඇවිත් දර ගොඩක් ගැහුවා.ගල් දෙකක් එකට අතුල්ලලා ගිනි ගොඩක් පත්තු කළා.



ඊට පස්සේ එයා ඔහොම ඉන්න කොට එයා දැක්කා වලහෙක් ඒ පැත්තට එනවා. එයා ගිනි පෙනෙල්ලක් අරන් වලහ පැත්තට දික් කළා.



වලහා බය වෙලා කැළෑව ඇතුළටම දිව්වා.



ඊට පස්සේ එයා කැළෑවෙන් ගෙනත් හදා ගත්ත

කොළ ගොඩ උඩ හොදට නිදා ගත්තා.



එයා උදේ නැගිටලා ගුහාවෙන් එලියට යන කොට එයාගේ පූසයි, ඊට පිටිපස්සෙන් එයාගේ අම්මයි තාත්තයි අවිත් හිටියා. ඊට පස්සේ එයාලා ඔක්කොම සතුටින් ආපහු ගෙදර ගියා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි.  නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ති්‍රය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN:978-624-211-026-4